# පහන් සිතින් ඒදණ්ඩක් සෑදීම සක්විති රජ පදවි ලබා නිවන් දකින තෙක් සුගතිගාමී වීමට මඟකි

## තරණීය ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 418 - 419)

මිනිසුන්ගේ ගමන් බිමන් පහසුව පිණිස පහන් සිතින් සියතින් ම ඒ දණ්ඩක් සෑදූ කෙනෙක් එහි විපාකය ලෙස කල්ප අනූ එකක් දුගතිගාමී නොවී සිට සක්විති රජ සම්පත් ද ලබා ගෞතම බුද්ධ ශාසනයේ පැවිදි ව රහත් බව ලබා පිරිනිවී සැනසුණා.